ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ
***

## පුවත්පත් නිවේදනය

## ඖෂධ සහ වෛද්‍ය සැපයුම් භාර දීම

මහ කොමසාරිස් ගෝපාල් බාග්ලේ මහතා විසින් 2022 අප්‍රේල් 29 වන දින ඖෂධ සහ වෛද්‍ය සැපයුම් විශාල තොගයක් සෞඛ්‍ය අමාත්‍ය චන්න ජයසුමන මහ වෙත භාර දෙන ලදී. ඉන්දීය ජනතාවගේ තිළිණයක් වන මෙම වෛද්‍ය සැපයුම් තොගය ශ්‍රී ලංකාවට කඩිනමින් භාර දීම සඳහා ඉන්දීය නාවික හමුදාවේ ඝාරියල් නෞකාව විශේෂයෙන් යොදවා තිබිණ.

2. පේරාදෙණිය ශික්ෂණ රෝහලේ ඉල්ලීමක් අනුව මෙම වෛද්‍ය සැපයුම් තොගය ශ්‍රී ලංකාවට ලබා දේ. පේරාදෙණිය ශික්ෂණ රෝහලේ පැවති අත්‍යාවශ්‍ය වෛද්‍ය සැපයුම් හිඟය 2022 මාර්තු මාසයේ ශ්‍රී ලංකා සංචාරයක නිරත වූ විදේශ කටයුතු අමාත්‍ය ආචාර්ය එස්. ජයිශංකර් මහතාගේ අවධානයට ලක් විය.

3. ශ්‍රී ලංකාවේ සෑම ප්‍රදේශයකම විවිධ වෛද්‍යායතනයන් විසින් කරන ලද ඉල්ලීම් අනුව ඉන්දියාවෙන් තවත් වෛද්‍ය සැපයුම් තොග ලබාදීමට නියමිතය. මීට අමතරව ආහාර, ඖෂධ වැනි අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය සඳහා වන ඇමරිකානු ඩොලර් බිලියන 1ක ණය පහසුකම යටතේ වෛද්‍ය සැපයුම් ලබා දීම සඳහා ඇමරිකානු ඩොලර් මිලියන 200ක් වෙන් කර තිබේ.

4. ඉන්දියාව පසුගිය මාස කිහිපයක සිට ශ්‍රී ලංකාවට කඩිනම් සහය ලබා දේ. 2022 වසරේදී පමණක් ආසන්න වශයෙන් ඇමරිකානු ඩොලර් බිලියන 3ක් වන සමස්ත ආර්ථික සහයෝගය විවිධාකර අයුරින් ශ්‍රී ලංකාවට හිමි වී ඇත. අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය වෙනුවෙන් වන ඇමරිකානු ඩොලර් බිලියන 1ක ණය පහසුකම, පෙට්‍රෝලියම් නිෂ්පාදන සඳහා වන ඇමරිකානු ඩොලර් මිලියන 500ක ණය පහසුකම, ඇමරිකානු ඩොලර් මිලියන 400ක ද්විපාර්ශවික විනිමය හුවමාරු පහසුකම සහ ආසියානු නිෂ්කාෂණ සංගම් රාමුව යටතේ ඇමරිකානු ඩොලර් බිලියන 1ක සහය යනාදිය මෙයට ඇතුළත් වේ. ඇමරිකානු

ඩොලර් බිලියන 1ක ණය පහසුකම මේ වන විට ක්‍රියාත්මක අතර ඒ යටතේ දැනටමත් සහල් මෙට්‍රික් ටොන් 16,000ක් ශ්‍රී ලංකාවට භාර දී ඇත.

***

කොළඹ
2022 අප්‍රේල් 29